Sample Copy

00056

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - **2023/2024**
**5** වන මට්ටම
**LLU 5811** - පරිසර නීතිය
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය **II**
කාලය පැය **(01)** එකයි

---

දිනය - 2025 ජනවාරි 10 වේලාව - ප.ව. 01.30 – ප.ව.02.30

---

පහත ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. නීලා යනු ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ ජීවත්වන වයස අවුරුදු දහයක දැරියකි. ඇය ජීවත් වන ගම්මානය පසුගිය වසර තුනේදී ගංවතුර සහ නියගයන්ට හසුව ඇත.ගොවියකු වන ඇයගේ පියා බෝග වගාවන් සිදු කිරීමට නොහැකි වීම හේතුවෙන් ඔහුගේ පවුලට සහය දැක්වීමට නොහැකිව තිබේ. පසුගිය වසර පුරාවට නීලා පාසල් ගොස් නොතිබිණි. රජය විසින් නීලා ජීවත් වන ගම ආසන්නයේ වෙනත් ගල් අඟුරු බලාගාරයක් ඉදි කිරීමට ද යෝජනා කර ඇත.

   නීලා, ඇයගේ පියා මාර්ගයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනුකර ඇත. ඇය චෝදනා කරන්නේ ශ්‍රී ලංකා රජය, කාලගුණ විපර්යාසයන්ගේ බලපෑම් අවම කිරීමට ප්‍රමාණවත් පියවර නොගන්නා බවත් ඇයගේ පියා වැනි ගොවියන්ට කෘෂිකර්මාන්තයෙන් ඔවුන්ගේ ජීවනෝපාය අඛණ්ඩව සිදුකරගෙන යාමට සහාය නොදක්වන බවත්ය.ඇය තවදුරටත් චෝදනා කරමින් කියා සිටින්නේ ඇය සහ ඇගේ ගමේ අනෙකුත් දරුවන්ට වසරක කාලයක් පාසල් යාමට නොහැකි වීමෙන් ඇයගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවය. ඇය තවදුරටත් තර්ක කරන්නේ තවත් ගල් අඟුරු බලාගාරයක් ඉදිකිරීමේ රජයේ සැලසුම තිරසාර නොවන බවට සහ කාලගුණ විපර්යාසයන්ට සහය ලබා දෙන බවය.

   ඔබ මෙම නඩුවේ විනිසුරු යැයි උපකල්පනය කරන්න. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන, අනෙකුත් ශ්‍රී ලංකාවේ නීති සහ නඩු තීන්දු සහ පරිසර නීති මූලධර්ම පදනම් කරගෙන නීලා විසින් සිදු කරන තර්කයන් ඔබ විසින් ආමන්ත්‍රණය කරන්නේ කෙසේ ද යන්න පැහැදිලි කරන්න. ***Rabab Ali v. Federation of Pakistan & Another (Constitution Petition 2006)*** යන පකිස්ථානු නඩු තීරණය සහ වෙනත් රටවල අධිකරණ තීරණ ඔබේ නඩු තීන්දුවට අදාළ කරගන්න.

**(ලකුණු 20)**

***හිමිකම් ඇවිරිණි.***